දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No.

මගේ අංකය / எமது இல / My No — ED/03/55/03/3(1)

මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව

දිනය / திகதி / Date — 2011.12.12

චක්‍රලේඛ අංකය :- 2011/33

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලුම විදුහල්පතිවරුන් වෙත

**මීලා- දුන්- නබි (මුහම්මද් නබි නායකතුමාගේ උපන්දිනය) සැමරීම - 2012**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව "දැනුමෙන් පිරිපුන් යහපත් විනය ගරුක අනාගත පරපුරක් බිහිකිරීම" යන ජාතික සංස්කෘතික අනන්‍යතාවය සුරක්ෂිත කරගැනීම මුල්කර ගෙන රට පුරා ඇති මුස්ලිම් පාසල්වල හා මුස්ලිම් සිසුන් ඉගෙන ගන්නා සෙසු පාසල්වල මීලා-දුන්-නබි සැමරීමේ උත්සව පැවැත්වීමට තීරණය කර ඇත.

02. 2012 වර්ෂයේ පෙබරවාරි 08 වැනි දින රට පුරා සියලුම මුස්ලිම් පාසල්වල හා මුස්ලිම් සිසුන් ඉගෙන ගන්නා සෙසු පාසල්වල ද පාසල් මට්ටමින් මීලා-දුන්-නබි උත්සව පැවැත්විය යුතුය. ඉස්ලාමීය සංස්කෘතිය සුරක්ෂිත කර ගැනීම, මුස්ලිම්වරුන්ගේ සිත් තුළ ආගමික දැනුම වර්ධනය හා යහපත් ආකල්ප වර්ධනය කර ගැනීම සහ අනෙකුත් ජන වර්ග අතර සහෝදරත්වය, සහයෝගිතාව සහ සහජීවනය යනාදිය ඇති කර ගැනීමත් ආදර්ශමත් භාවයෙන්, එකගත්වයෙන් ජීවත්වීමට මඟපෙන්වීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ.

03. විදුහල්පතිවරු විසින් 2012 වර්ෂයේ ජනවාරි මස 10 වැනි දින මේ හා සම්බන්ධ සියලු ගුරුභවතුන දැනුවත් කර පාසල තුළ මිලා-දුන්-නබි උත්සවය පවත්වන ආකාරය පිළිබඳ තීරණය කර පසුදින (ජනවාරි මස 11 වන දින) පාසලේ සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. මෙම වැඩසටහන උපරිම අවධානයක් ලබා දී ක්‍රියාත්මක කළ යුතු අතර පාසල් සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට කිසිදු බාධාවක් ඇති නොවන පරිදි පැවැත්විය යුතුය. පාසල විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු වේලාවක් තීරණය කළ යුතු අතර මේ සඳහා ගුරුවරුන්ගේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහභාගීත්වය ද මීට අමතරව පාසල් ප්‍රජාවේ සහභාගීත්වය ද ලබා ගත යුතුය. අවශ්‍ය වන්නේ නම් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පාසල තුළ කමිටුවක් පත්කර ගත හැකිය.

04 මෙම උත්සවය මගින් පහත සඳහන් කාර්යය ඉටු කර ගැනීමට අපෙක්ෂා කෙරේ

01. පූජකතුමන් හා අනෙකුත් ආගම් අදහන අයට ගරු කිරීමට මග පෙන්වා දීම.

02. මුස්ලිම් ශිෂ්‍යයන්ට තමන්ගේ මව, පියා, සොයුරන්, විදුහල්පති, ගුරුවරුන් මෙන්ම වැඩිහිටියන්ට ද සලාම් (අස්සලාමු අලෙයිකුම්) පැවසීමටත් අනෙකුත් අයට ගරු කිරීමටත් අවශ්‍ය ආකල්ප වර්ධනය කිරීම.

03. පාසල මෙන්ම නිවසේ පරිසරය ද පිරිසිදුව හා අලංකාරව තබා ගත යුතු අතර පලතුරු ගස් හා සෙවණ ලබා දෙන ගස් සිටවීම හා ඒවා පෝෂණය කිරීම.

04. දිනපතා පාසල ආරම්භ කිරීමට පෙර ශුද්ධ වූ අල්-කුර්ආන් වාක්‍ය පාඨ පාරායනය කිරීමට හා ඒවා ශිෂ්‍යයන්ට ශ්‍රවණය කිරීමට මගපෙන්වීම.

05. පාසල ආරම්භ කරන විටත් අවසන් කරන විටත් මුහම්මද් නබි නායකතුමන්ගේ නාමයෙන් සලවාත් කිව යුතුය.

06. උදෑසන රැස්වීම්වලදී ගුරුවරුන් මෙන්ම ශිෂ්‍යයන් ද, මුහම්මද් නබි නායකතුමන්ගේ මෙන්ම කුලෆා-උර්-රාසිදූන්වරුන්ගේ ද (යහමග ගිය කලීෆාවරුන් 4 දෙනාගේ ද) සහාබාවරුන්ගේ ද තාබියීන්වරුන්ගේ ද තබඋත්තාබියීන්වරුන්ගේ ද යහගුණ පැවසීම.

07. 1 වන ශ්‍රේණියේ සිට 9 වන ශ්‍රේණිය දක්වා ශිෂ්‍යයන්ට තමන්ගේ යහපත් පුරුදු සටහන් කර ගන්නා ක්‍රමවේදයක් ආරම්භ කර වර්ෂ අවසානයේ හොඳ ශිෂ්‍යයන් තේරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

08. මුස්ලිම් පාසල් ශිෂ්‍යයන් අරාබි, අරාබි සාහිත්‍ය යන විෂයයන් ඉගෙන ගැනීම සඳහා අවධානය යොමුකළ යුතුය.

09. පාසල මගින් සැසි, සාකච්ඡා, කවි, නාට්‍ය, කසීදා, රචනා, සංවාද, අරාබි අක්ෂර අලංකරණ කලාව කණ්ඩායම් ක්‍රියාකාරකම්, ශ්‍රමදාන හා ප්‍රදර්ශන කිරීම් වැනි ක්‍රියාවන්ට මග පෙන්විය යුතුය.

10. ශිෂ්‍යයන්ට පාසල් පුස්තකාල මගින් ඉස්ලාමීය පොත් පත් කියවීමට මඟ පෙන්වීම.

11. පාසල්වල පවතින මුස්ලිම් මජිලිසය (රැස්වීම) ප්‍රසිද්ධ ලෙස නැවත සකස් කර එමගින් ඊට අදාල වාර්ෂික ක්‍රියාකාරකම් විධිමත්ව ක්‍රියාත්මක කිරීමට ශිෂ්‍යයන්ට මඟ පෙන්විය යුතුය.

12. මස්ජිදයට (මුස්ලිම් පල්ලියට) නැමදීම සඳහා යන කුඩා අයගේ සිට වැඩිහිටි අය දක්වා පිරිසිදු සුදු හෝ වඩාත් සුදුසු ඇඳුමෙන් සැරසී යාමට මඟ පෙන්වීම.

13. සිකුරාදා දිනයන්හි දී නියමිත වේලාවට සියලු මුස්ලිම් පිරිමි ශිෂ්‍යයන් ද සියලු මුස්ලිම් පිරිමි ගුරුවරුන් ද මස්ජිදයට ගොස් (මුස්ලිම් පල්ලි) ජුම්ආ දේශනයට සවන්දීම මෙන්ම ජුම්ආ යුතුකම් (සිකුරාදා ජුම්ආ සලාතය) ද ඉටු කිරීම.

14. අහදියා (ඉස්ලාමීය) දහම් පාසල්වලට මෙන්ම සවස් කාලයෙහි අල්-කුර්ආන් මද්රසාවන්ට (සවස අල්-කුර්ආන් පාසලට) යන සිසුන් දිරිගැන්විය යුතු අතර නොයන සිසුන්ගේ ගැටළු සොයා බලා විසඳීම් ලබා දිය යුතුය.

15. මුස්ලිම් නිවෙස්වල ඉස්ලාමීය පසුබිම් ඇති කිරීමත් සමඟ ඉස්ලාමීය ගති පැවතුම් අංග පිළිපැදීමටත් මඟ පෙන්විය යුතුය.

16. සියලු මුස්ලිම් නිවෙස්වල කුඩා පුස්තකාල ඇති කර ඉස්ලාමීය පොත්පත් සොයා ගැනීමටත් සිසුන්ට මෙන්ම දෙමාපියන්යට් ද උපදෙස් ලබාදිය යුතුය.

17. සියලු ජීවීන්ට ආදරය හා කරුණාව දැක්විය යුතුය.

2012 වර්ෂයේ එකම දිනයක ජාතික මට්ටමින් මිලා-දුන්-නබි දින උත්සවය සාර්ථකව පැවැත්වීමට අවශ්‍ය සහයෝගය අපේක්ෂා කරමි.

එච්.එම්. ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. විභාග කොමසාරිස් ජනරාල් - විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ ජෙනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
3. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
4. ප්‍රධාන කොමසාරිස් - අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව
5. අධ්‍යක්ෂ - මුස්ලිම් ආගමික සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
6. සියලුම මාණ්ඩලික නිලධාරීන් - අධ්‍යාපන අමාත්‍යාංශය